පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයඃ- පෙරදිග සංගීතය

ජූනි සතියඃ- 2

ශ්‍රේණිය ඃ- 10

Prepared by- Ravi Kurulugama
(Music Teacher:- Ke/Dehi/Waharaka M.M.V.

නිපුනතා මට්ටම 3.1 ඃ-ව්‍යවහාරික සංගීතයේ විවිධ අවස්ථා හදුනා ගනිමින් එක් එක් යුග වලට අයත් ගී ගායනය හා රසවින්දනය

- කපිඤ්ඤා ගීතවල ස්වභාවය (මෙම සටහන හොදින් කියවන්න)

1505 පෘතුග්‍රීසී ආක්‍රමණයෙන් ලංකාවට පැමිණි වහල් මෙහෙයේ සිටි කාපිරි ජනයා ඔවුන් ලද විවේකයේදී කළ බයිලානම් නැටුම් විශේෂයට ගැයූ ගීත ලෙස කපිරිඤ්ඤා හැදින්වේ. පසුකාලීනව කාපිරි ජනයා හා පෘතුග්‍රීසින්ද , සිංහල ජනයාද එක්ව ගොඩනැගු ගීත ශෛලියක් ලෙස මෙය හැදින්වේ. මෙම ගීත මුලින් ප්‍රචලිතව පැවතියේ පුත්තලම, හලාවත, මඩකලපුව ආදී මුහුදුබඩ ප්‍රදේශ වලය, පසුව රට පුරාම ප්‍රචලිත වී තිබේ.
මේ සඳහා යොදාගත් සංගීත භාණ්ඩ ලෙස රබාන, මැන්ඩලීන්, බැංජො, ගිටාර්, බොංගෝ, ටැම්බරීන් රවිකිඤ්ඤය (වයලීනය) වියෝලා වැනි භාණ්ඩ දැක්විය හැකිය
මෙම ගීත ගායනයේදී හැදි , පොල්කටු හෝ වෙනත් අතට අහුවන යම් දෙයක් ගෙන ඒවා පොළවට තට්ටුකරමින් හා රිද්මයට සොලවමින් ගායනයේ යෙදීමද නර්තනයේ යෙදීමද ඔවුන් සිදුකරයි.
බොහෝ ගීත සඳහා 6/8 රිද්ම රටාව භාවිතා කිරීමත් ක්‍රමයෙන් ගීතියේ වේගය හෙවත් ලය වැඩි වන ලෙස ගෘයනය කිරීමත්, සාමුහිකව කණ්ඩායම් වශයෙන් ගායනයේ යෙදීම, ඒකාකතාරී වූ සරළ තණු භාවිතය , ගැහැණු පිරිමි දෙපක්ෂයම හා බාල මහළු සියලු දෙන එක්ව ගායනය කිරීම දක්නට ලැබේ.
මෙම ගීත සඳහා ස්පාඤ්ඤ භාෂාව යොදාගෙන තිබේ.
පසුකාලීනව මෙම ගීත ආභාෂයෙන් සිංහල ගීත රාශියක් නිර්මාණය වී තිබේ.

- සිංගල ගීත ගායනා කළ ගායක ගායිකවන්
  (වෙලී බැස්තියන්, එම්.එස්. ප්‍රනාන්දු(බයිලා චක්‍රවර්තී) ඇන්ටන් ජෝන්, සී. ටී. ප්‍රනාන්දු, මැක්ස්වෙල් මෙන්ඩිස්)
- මෙම ගීත ආභාෂයෙන් නිර්මාණය වූ සිංහල ගීත
  (මාගේ පැලෙ අඳුර නසන්න, රස ආහර කවාලා, ලස්සනට පිපිණු, නෝනා මගෙනර්ස් නෝනා, යමන් බන්ඩෝ වෙසක් බලන්න, මහා මෙරක් ලෙසට)

කපිරිඤ්ඤා ගීතයක්ඃ-

තැර ඉස්ති තැර - නොස්ස බැටික්ලො තැර
දිසිය නසාම් තුදුස් කරාවී
ඔයා ඉස්ති තැර - තෙම්නොස ග්‍රැන්දෑස
පේසිත කන් - තා ඉස්ති තැර
කම්බ්‍රාංකුම් පේසි තෙම්ලු වාර - කාර්නි කංගෙයි ජුන්තදි තැර
ආල්තු කොකේරස් ඉන්විදු වර්සීන් - බූනීතුලෙයි තේම් නොස්ස තැර
වියෝල ගිටාර්කුම් රබානා - පොල්ගාදි තේම් නොස්ස තැර
ලැන්සස් කපිරිඤ්ඤා - නොස්ස බයිලා
කොන්තේන්ති මැන්තැව් සුව තැර

ක්‍රියාකාරකමඃ-

1- ඉහත සටහන සංගීත පොතෙහි පිටපත් කරගන්න
2- අන්තර්ජාලයේ ඇති මෙම ගී ශ්‍රවණය කරන්න
3- මෙම ගීත වල පදමාලා කිහිපයක් සටහන් පොතෙහි ලියා ගන්න
4- වැඩි වාර ගනනක් එම ගීත ශ්‍රවණය කරමින් ගායනය පුහුණු වන්න
5- කපිරිඤ්ඤා ගීත පිළිබඳ තොරතුරු එක්රැස් කරන්න